# ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල

# ඇබෑර්තු

## ආහාර භාරකාරිණී තනතුර

ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපනික සුදුසුකම් :**

අ.පො.ස. (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී, සිංහල/ දෙමළ භාෂා හා ගණිතය ඇතුළත්ව සම්මාන සාමාර්ථ හතරක් සමග විෂයයන් හයකින් සමත්ව සිටීම.

**වයස** : අවුරුදු 25 ට නොඅඩු විය යුතු අතර, 40 ට නොවැඩි විය යුතුය.

**පළපුරුද්ද:** ප්‍රසිද්ධ ආයතනයක, ආහාර භාරකාරිණී තනතුරක හෝ ඊ හා සමාන තනතුරක වසර 03 ක පළපුරුද්ද තිබිය යුතුය.

**වැටුප** : වැටුප් කේතය MN1 - III ශ්‍රේණිය

**රු. 36,640-10X405-40,690/- (මසකට)**

වැටුපට අමතරව සියලුම අදාළ අනුමත දීමනා ද ගෙවනු ලැබේ.

**සේවයේ යෙදවීමේ නියමයන් :**

**ස්ථිර හා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය පදනමින් සිදු කෙරේ.**

රජයේ සේවයේ තනතුරු දරන අයදුම්කරුවන් විසින්, තම අයදුම්පත්, අදාල ආයතන ප්‍රධානි මගින් එවිය යුතු අතර, සෘජු පිටපතක්ද යොමු කළ යුතුය. අයදුම්කරු මෙම තනතුරට තෝරාගත හොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණ ඇතුළත්ව අදාළ ආයතන ප්‍රධානි විසින් නිකුත් කළ සහතිකයක් අයදුම්පත සමග ඉදිරිපත්කළ යුතුය.

මෙම තනතුර සඳහා අයෙකු බඳවා ගන්නේද නැද්ද යන කරුණු පිළිබඳ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහරෝහ්‍යශාලා පාලක මණ්ඩලය සතුවේ. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. තමන්ගේ සම්පූර්ණ ජීව දත්ත හා ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) විස්තර සහිත අයදුම්පත් පහත සඳහන් අය වෙත ලැබෙනසේ **2024 ජනවාරි 06 වන දිනට** පෙර එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව,**
**තලපත්පිටිය, නුගේගොඩ.**
2023-12-20